


# ඓතිහාසික මිහින්තලය පුදබිම

## ස්ථානීය විස්තර සංග්‍රහය


ඉතිහාස සංගමය | සංචාරක මාර්ගෝපදේශක සංසදය
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

# ඓතිහාසික මිහින්තලා

# පුදබිම

## ස්ථානීය විස්තර සංග්‍රහය

ඉතිහාස සංගමය / සංචාරක මාර්ගෝපදේශක සංසදය
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශයේ, ඉතිහාස සංගමය සහ සංචාරක මාර්ගෝපදේශක සංසදයේ නියමු ව්‍යාපෘතියකි.

ග්‍රන්ථය සම්පාදනය : ඉරේෂා මධුවන්ති වික්‍රමසිංහ

පිටකවරය : තුසිත දිසානායක

උපදේශකත්වය : මහාචාර්ය එම්. කේ. එල්. අයිරාංගනී

අංශාධිපති, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය

ඉතිහාසය විෂයෙහි ආචාර්ය මණ්ඩලය

## පටුන


1. ඓතිහාසික මිහින්තලා පුරවරය

2. මිහින්තලේ පුරාවිද්‍යා පරිශ්‍රයෙහි සිතියම

3. මිහින්තලේ පුරාවිද්‍යා පරිශ්‍රයේ වැදගත් ස්ථාන

    3.1. මිහින්තලේ පුරාවිද්‍යා කෞතුකාගාරය

    3.2 මිහින්තලේ පැරණි රෝහල

    3.3. මණිනාග විහාර පරිශ්‍රය

    3.4. ගිරිභණ්ඩ සෑය

    3.5. කණ්ටක චේතිය

    3.6. මැද මළුව

        3.6.1. දානශාලාව

        3.6.2. ධාතු මන්දිරය

        3.6.3. සන්නිපාත ශාලාව

    3.7. සේල චෛත්‍යය

    3.8. ආරාධනා ගල

    3.9. මිහින්තලේ මහ සෑය සහ මිහිඳු සෑය

    3.10. නාග පොකුණ

    3.11. සිංහ පොකුණ

    3.12. ඇත් වෙහෙර

    3.13. කටුසෑය

    3.14. ඉදිකටුසෑය පරිශ්‍රය

    3.15. රාජගිරි ලෙන කන්ද පරිශ්‍රය

    3.16. අටසැටලෙන්

    3.17. කළුදියපොකුණ පරිශ්‍රය

# හැඳින්වීම

සිංහල බොදුනු සංසක්‍තියේ තිඹිරිගෙය වන මිහින්තලය අනුබුදු මිහිඳු හිමියන් ලක්දිවට බුදුදහම ගෙන පැමිණ ප්‍රථම ධර්ම දේශනාවන්ගෙන් ආලෝකමත් වූ පුණ්‍ය ස්ථානයයි. අනුරාධපුර අවධියේ එළාර නම් දකුණු ඉන්දීය ආක්‍රමණිකයා පවා මෙම භූමියට පැමිණ භික්ෂූණ් වහන්සේලා වැඳ පුදාගනිමින් මෙහි සංචාරය කර තිබේ. මිහිඳු හිමියන්ගේ ආගමනයෙන් අනතුරුව මිහින්තලාව බෞද්ධ ආරාමික මධ්‍යස්ථානයක් පමණක්ම නොවී එය බෞද්ධයින් ප්‍රමුඛ සියළු ශ්‍රී ලාංකේයන්ගේ වන්දනාවට පාත්‍ර වූ සංචාරක කේන්ද්‍රයක් බවට ද පත්ව තිබේ. සේල චෛත්‍යය, අම්බස්ථල මහ සෑය, කණ්ඨක චේතිය, ඇත් වෙහෙර ආදී වූ මිහින්තලා පරිශ්‍රයේ දක්නට ඇති අනේකවිධ ස්තූපයන් ද, ආරාධනා ගල ඇතුළු විහාර භූමිය ද බැතිමතුන්ගේ වන්දනාවට පාත්‍ර වේ. වර්තමානයේ දී මිහින්තලාව යනු වසරේ සෑම දිනකම දෙස් විදෙස් සංචාරකයන් සහ බැතිමතුන් සැරිසරන භූමි භාගයකි. විශේෂයෙන්ම සෑම වසරකම පොසොන් පොහොය යනු සියළු ශ්‍රී ලාංකේයන් මිහින්තලා පුණ්‍ය භූමිය වැඳ පුදා ගන්නා පොහෝ දිනයයි. එසේ ලක්ෂ සංඛ්‍යාත පිරිසක් පොසොන් මාසයෙහි මෙම පුරා පරිශ්‍රයට පැමිණෙන අතර මිහින්තලාවේ ප්‍රධාන ගල් පඩිපෙල ආශ්‍රිත නටබුන් හැරුණු විට අප්‍රකට ස්ථානයන් සහ ගමන් කිරීමේ දුශ්කර නමුත් අතිශය සෞන්දර්යාත්මක පරිසරයන් කෙරෙමි ඔවුන් තුළ ඇත්තේ අඩු අවබෝධයකි. එහෙයින් මිහින්තලාවට

පැමිණෙන සියළු බැතිමතුන්ගේ සහ සංචාරකයින්ගේ පරිශීලනය උදෙසා සරල ස්ථානීය විස්තරයක් සහ මිහින්තලාවේ ඓතිහාසික පසුබිම කෙරෙහි අවධානය යොමු කරමින් මෙම කෘතිය රචනා කර තිබේ.

# 1. ඓතිහාසික මිහින්තලා පුරවරය

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මිහින්තලේ පුරාවිද්‍යා පරිශ්‍රය ශ්‍රී ලාංකේය බෞද්ධ උරුමයේ තිඹිරිගෙය වශයෙන් දෙස් විදෙස් සංචාරකයින්ගේ සහ බැතිමතුන්ගේ ආකර්ශනයට පාත්‍ර වූ නටබුන් නගරයකි. ක්‍රිස්තු පූර්ව 247 පොසොන් මස පුන් පොහෝ දා භාරතීය අධිරාජ්‍යයා වූ ධර්මාශෝක රජුගේ පුත් මහින්ද මහ තෙරුණ් වහන්සේ සම්බුද්ධ දේශනයේ ආලෝකය රැගෙන මිහින්තලේට වැඩම කර ඇත. දේශීය බුදු සසුනේ ආරම්භය සනිටුහන් වූ එදින දේවානම්පියතිස්ස රජු සහ මිහිඳු මහතෙරුණ් වහන්සේ අතර ඇති වූ සබඳතාවයෙහි ප්‍රතිඵලයක් වශයෙන් බුදු දහම මෙරට රාජ්‍ය ආගම බවට පත්ව තිබේ. බොදුනුවන්ගේ විශ්වාසයට අනුව අතීත අනාගත කාලයන්හී සියළු බුදුවරුන්ගේ බුද්ධ ශාසනය ශ්‍රී ලංකාවේ මුල්බැසගන්නා ස්ථානය වන්නේ මිහින්තලයයි.

පුරාතන මූලාශ්‍රයන්ට අනුව මිහින්තලය හා බැඳි බෞද්ධ ඉතිහාසය ක්‍රි.පූ. තෙවැනි සියවසෙන් ද එපිටට ගමන් කරයි. මෙම කල්පයෙහි බුද්ධත්වයට පත් වූ කකුසඳ, කෝණාගමන සහ කාශ්‍යප බුදුරුන් විසින් ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය පිහිටුවීමේ දී ඒකී ප්‍රාරම්භය සනිටුහන් කළ ස්ථාන පිලිවෙලින් දේවකූට" සුමනකූට සහ

සුභකූට නමින් හඳුන්වා තිබේ. බුද්ධ වර්ෂයෙන් 236 වැන්නේ හෙවත් ක්‍රි'පූ'247 දී ගෞතම බුදුන් වහන්සේ විසින් දේශිත බුදු දහම මිහිඳු හිමියන් විසින් ස්ථාපිත කිරීමත් පෙර දැක්වූ තොරතුරුත් සංසන්දනය කිරීමේ දී මෙසේ විවිධ නම්වලින් හඳුන්වන ස්ථාන ද මිහින්තලේ ම විය හැකි යැයි අනුමානක ළ හැකිය. ඒමෙන්ම ගෞතම බුදුන් වහන්සේ තෙවන වරට ලංකාවට වැඩමකළ අවස්ථාවේ දී උන්වහන්සේ මිහින්තලේ සේල චෛත්‍යය යැයි දක්න භූමියෙහි වැඩ වාසය කළබව ද දක්වයි. එහෙයින් බුදුන් වහන්සේගේ පාද ස්ඵර්ශය ලත් සොළොස්මස්ථානයන්ගෙන් එකක් සේ මිහින්තලේ ද සලකා තිබේ.

මෞර්ය අධිරාජ්‍යය ධර්මාශෝකගේ අනුග්‍රහය ඇතිව මෙරට කිරුළු දැරූ දේවානම්පියතිස්ස රජු හමුවට ධර්මාශෝක රජුගේ පුත්‍ර වූ මිහිඳු හිමියන් හමුවන්නේ මිහින්තලා පුදබිමෙහි ය. මුව (ගෝණ) දඩයමේ සරමින් සිටි දේවානම්පියතිස්සයන්ට මිහිඳු හිමි ඇතුළු උත්තිය, ඉට්ඨිය, සම්බල, භද්දසාල, සුමන සාමණේර සහ භණ්ඩුක උපාසක යන බෞද්ධ දූත කණ්ඩායම හමුවන අතර මහාවංසයෙහි සඳහන් වන්නේ මෙම පිරිස අඹතෙලෙහි හෙවත් මිහින්තලා කඳු මුදුනේ ය. වර්තමානයේ එය ආරාධනා ගල යැයි සළකයි.

දේවානම්පියතිස්ස රජු (ක්‍රි.පූ.250-210) විසින් මිහිඳු මහතෙරුණ් වහන්සේ සමග සංවාද පවත්වමින් බුදුන් සරණ ගිය පසු උන්වහන්සේ රජු ප්‍රමුඛ සතළිස් දහසක් මහජනයාට චුල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කළ අතර භණ්ඩුක

උපාසක පැවිදි කරමින් මෙරට ප්‍රථම පැවිදි උපසම්පදාව සනිටුහන් කරමින් නිල වශයෙන් බුදු සසුන පිහිටුවා තිබේ. මහින්ද තෙරුණ් ප්‍රමුඛ භික්ෂූණ් මිහින්තලේ අටසැට ලෙන්හි වැඩ වාසය කිරීමත් සමග මෙරට ප්‍රථම බෞද්ධ විහාරය බවටද මිහින්තලේ පුදබිම පත් වේ. මූලාශ්‍ර පතපොතෙහි 'සෑගිරිය' ප්‍රකට මිහින්තලේ ආරාම සංකීර්ණය තුළ ලෙන් හැට අටක් පවතින්නේ යැයි ජනප්‍රවාදයන්හී එයි. එමෙන්ම මිහිඳු හිමි ඇතුළු පිරිස අනුරාධපුර මහාවිහාරය වෙත ගිය ද නැවත වස්වැසීම සඳහා මිහින්තලාවට පැමිණ තිබේ. පසුව සංඝමිත්තා තෙරණිය විසින් ශ්‍රී මහාබෝධීන් වහන්සේ වැඩමවීමෙන් අනතුරුව අෂ්ඨඵලරුහ බෝධීන් වහන්සේලා අතරින් එක් බෝධීන් වහන්සේ නමක් රෝපණය කරන්නේ ද මෙහිය.

දේවානම්පියතිස්ස රජුගෙන් අනතුරුව රාජත්වයට පත් උත්තිය රජුගේ කාලයේ දී මිහිඳු හිමි අපවත් වූ පසුව උන්වහන්සේගේ ධාතූන් තැන්පත් කර මිහින්තලේ ස්තූපයක් නිමවන අතර ආක්‍රමණිකයෙකු වූ එළාර රජු පවා සෑගිරියේ භික්ෂූණ් බැහැදැක සාමීචියෙහි නිරත වීමෙන් තහවුරු වනුයේ සමකාලීනව දිවයිනේ ප්‍රධානතම ආගමික මධ්‍යස්ථානයක් වශයෙන් මිහින්තලය ස්ථාපිත වී පැවති බවයි. ලජ්ජිතිස්ස රජු විසින් කටු සෑයේ ශිලා ධාතු සර්භය කරවන අතර කූටකණ්ණතිස්ස රජු විසින් උපෝසථඝරය නිමවා ඒ ආසන්නයේ ශිලාමය ස්තූපයක් ද කරවා බෝධීන්වහන්සේනමක් රොපණය කර තිබේ. පුරාවිද්‍යාඥයින්

විසින් මෙම ශිලාමය ස්තූපය වත්මන් මිහින්තලයේ සේල චෛත්‍යය යැයි හඳුනාගෙන ඇති අතර යටත්විජිතසමයේ සිදු වූ ප්‍රතිසංස්කරණයන්හී දී එහි සුදු හුණු ආලේප කිරීම හේතුවෙන් ශිලාමය ස්තූපයක් බව හඳුනාගැනීමට අපහසුව තිබේ. මිහින්තලා ගිරි මුදුනහි ඇති අම්බස්ථල මහා සෑය නිමවන්නේ මහාදාඨික මහානාග රජු විසින් ය. පසුකාලීනව කණිට්ඨතිස්ස රජු විසින් එම ස්තූපය ප්‍රතිසංස්කරණය කරවා තිබේ. භාතිකාභය රජු, වසභ රජු සහ පළමුවැනි ජෙට්ඨතිස්ස රජු මිහින්තලේ විහාරවාසී භිකෂූණ් උදෙසා විවිධ පුදපූජාවන් පැවැත්වූ බවට මහාවංශයෙහි සඳහන් වේ.

මිහින්තලා විහාර වාසී භික්ෂු පරම්පරාවට අයත් වූ භික්ෂූණ් පිරිසක් කුමන්ත්‍රණය කරමින් රජු මරා දැමීමට උත්සහ කලේයැයි සැක කළ කණිජානුතිස්ස රජු විසින් එම භික්ෂූණ් මරණ දණ්ඩනයට යටත්කොට ඇති අතර මහසෙන් රාජ්‍ය සමය වනවිට මෙම භික්ෂූණ් ථේරවාදයෙන් මිදී මහායානික ධම්මරුචි නිකායික දේශනාවන් කෙරෙහි යොමු වී ඇත. මිහින්තලේ කටු සෑය ආශ්‍රිතව හමුවන මහායාන පාඨ සහිත පත්තිරු තුළින් ද ඒ බව තහවුරු වේ. කීර්ති ශ්‍රී මේඝවර්ණ රාජ්‍ය සමයේ දී මිහිඳු හිමිගේ රන් ප්‍රතිමාවක් කරවා පෙරහැර කරමින් පුද පූජා පවත්වා තිබේ. පළමුවැනි අග්ගබෝධි රජු, තෙවැනි අග්ගබෝධි රජු සහ පස්වැනි අග්ගබෝධි රජු ද සෑගිරියට විවිධාකාර දායකත්වයන් දක්වා ඇති අතර පළමුවන උදය රජුගේ බිසව විසින් මිහින්තලේ කටුසෑය කරවා ඇත. හතරවැනි කාශ්‍යප සමයේ දී ළංගසේන


නම් සෙනෙවියා විසින් මෙහි පිරිවෙණක් කරවා ඇති අතර එයින් සැගිරිය ආශ්‍රිතව අධ්‍යාපන මධ්‍යස්ථානයක් පවා පැවත ඇති බව තහවුරු වේ. අනුරාධපුරය බිඳ වැටීමෙන් අනතුරුව විනාශමුඛයට පත් මිහින්තලා විහාර සංකීර්ණය පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් ප්‍රතිසංස්කරණය කර තිබේ.

රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් අනතුරුව මිහින්තලා විහාර සංකීර්ණය ද ඒ ආශ්‍රිත පරිසර පද්ධතිය ද ක්‍රමයෙන් ජරාජීර්ණත්වයට පත්ව භික්ෂු වාසයෙන් ද තොර හුදෙකලා නටබුන් සංකීර්ණයක් බවට පත්ව ඇත. එමර්සන්ට් ටෙනන්ට්, පී. ගෝල්ඩ්ස්මිත්, ආර්.ඩබ්.අයිවර්ස්, දොන් මර්තිනු ද සිල්වා වික්‍රමසිංහ වැන්නවුන්ගේ වාර්තාවන් අනුව වල් අලින්ගෙන් ගහණ වූ මිනිස් වාසයට නුසුදුසු ස්ථානයක් බවට මිහින්තලාව පත්ව තිබේ. වර්ෂ 1910න් පසුව එච්.සී.පී බෙල්ගේ මූලිකත්වයෙන් මිහින්තලේ පුරාවිද්‍යා කැණීම් සහ සංරක්ෂණයන් ආරම්භ වීමත්, වලිසිංහ හරිස්චන්ද්‍රයන්ගේ බෞද්ධ පුදබිම් යළි නගා සිටුවීමේ ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස පිහිටුවා ගත් මිහින්තලේ බෞද්ධ සමාගම මගින් මේ පිළිබඳ මහජන දැනුවත් කිරීම් හා බිම් පාදාගැනීම හේතුවෙන් මෙහි පවත්නා වූ ඓතිහාසික වටිනාකම යළි ඉස්මතු කරගැන්මට හැකි වී තිබේ.

එච්.සී.පී.බෙල්, පී.ගෝල්ඩ්ස්මිත්, දොන් මර්තිනු ද සිල්වා වික්‍රමසිංහ, සෙනරත් පරණවිතාන යන පුරාවිද්‍යාඥයන්ගේ ද, වීරපොකුණේ ගුණරතන හිමි, කුඹුක්වැවේ රේවත හිමි, තිබ්බටුවේ ශ්‍රී සිද්ධාර්ත සුමංගල

හිමි, වළවාහැංගුණුවැවේ රතනජෝති හිමි ආදී භික්ෂූණ්ගේ ද, වලිසිංහ හරිස්චන්ද්‍ර වැනි පුද්ගලයින්ගේ ද අප්‍රතිහත කැපවීම් ඔස්සේ වත්මනෙහි විධිමත් පුරාවිද්‍යා ක්ෂේත්‍රයක් සහ දියුණු බෞද්ධ විහාරයක් වශයෙන් මිහින්තලාව දැකගත හැකි වේ. වත්මන් මිහින්තලා විහාර පරිශ්‍රයේ බලාධිකාරය හොබවනුයේ වළවාහැංගුණුවැවේ ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

## 2. මිහින්තලේ පුරාවිද්‍යා පරිශ්‍රයෙහි සිතියම



1. නවීන වතුර මල
2. පුරාවිද්‍යා කෞතුකාගාරය
3. මිහින්තලේ පැරණි රෝහල
4. මණිනාග පොකුණ
5. මණිනාග විහාරය
6. ගිරිභණ්ඩ සෑය
8. තිඹිරි පොකුණ
9. කණ්ඨක චේතිය
10. සිංහ පොකුණ
11. දානශාලාව
12. ධාතු මන්දිරය
13. සන්නිපාත ශාලාව
14. නව බුද්ධ ප්‍රතිමාව
15. නව ධාතු මන්දිරය
16. සේල චෛත්‍යය
17. ආරාධනා ගල
18. මිහිඳු ගුහාව
19. අම්බස්ථල මහා සෑය
20. මිහිඳුසෑය
21. නාග පොකුණ
22. ඇත් වෙහෙර
23. ඉදිකටු සෑය
24. පොකුණ
25. කටුසෑය
26. රාජගිරි කන්ද විහාරය
27. කළුදිය පොකුණ
28. කළුදිය පොකුණ තපෝවනය

# 3. මිහින්තලේ පුරාවිද්‍යා පරිශ්‍රයේ වැදගත් ස්ථාන

## 3.1. මිහින්තලේ පුරාවිද්‍යා කෞතුකාගාරය

මිහින්තලේ නගරයේ සිට පරිශ්‍රයට ප්‍රවේශ වන්නෙකුට ප්‍රථමයෙන් මිහින්තලේ පුරාවිද්‍යා කෞතුකාගාරය දැකගත හැකි වේ. 1984 වසරේ මිහින්තලේ ප්‍රදේශයේ පැවති ගම්උදා වැඩසටහනට සමගාමීව ඉදිකළ සංචාරක නිවාසය පසුකාලීනව මිහින්තලයෙන් හමු වූ වටිනා පුරාවස්තූන් ප්‍රදර්ශනය කිරීම උදෙසා කෞතුකාගාරයක් බවට පත්කර ඇත. සෙනරත් පරණවිතානයන් විසින් මිහින්තලේ කණ්ඨක චෛත්‍ය ආසන්නයේ වූ අප්‍රකට ස්තූපයක් (ගිරිභණ්ඩ සෑය) කැණීමේදී පාදාගත් ධාතු ගර්භයක් මෙහි ප්‍රවේශ ද්වාරය සමීපයේම තැන්පත් කර ඇති අතර එහි මහාමේරුව සහ ත්‍රිකූටකය යන වස්තූන්ට අමතරව බදාම සහිත බිත්තිවල දේවතා රූප පිළිබිඹු කරන සිතුවම් ඇඳ තිබේ. විවිධ දේවතා රූප, මල් ලියකම් ආදී රේඛාමය සිතුවම් අදටත් මෙහි වඩාත් පැහැදිලිව හඳුනාගත හැකිය. ධාතු ගර්භය සහිත ප්‍රවේශ කුටියෙහි පැරණි සෙල් කරඬු, යන්ත්‍ර ගල් ආදිය ද ප්‍රදර්ශනයට තබා ඇත. කෞතුකාගාරයේ පළමු ප්‍රදර්ශන කුටියේ මිහින්තලා පරිශ්‍රයෙහි භූමි ආකෘතියක් නිමවා ඇති අතර අංක දෙක සහ තුන කුටිවල මිහින්තලා පරිශ්‍රයේ ජලකළමනාකරණ ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීමක් සහ විවිධ ප්‍රදේශයන්හී හමු වූ පුරාවස්තූන් තැන්පත් කර ඇත. ඒ

අතර මිහින්තලේ නාග පොකුණේ සිට දානශාලාව දක්වා ජලය ගෙන ආ මැටි නළ වලට හිමිවන්නේ විශේෂත්වයකි. ජන්තාඝර ආශ්‍රිත පැරණි සෞඛ්‍ය ස්වස්ථතා ක්‍රමවේද හඳුන්වාදෙන කුටියක් තුළ භික්ෂූන්ගේ අවශ්‍යතා සඳහා ගිනිහල් ගෙයක් නිර්මාණය වී පැවතියේ කෙසේ දැයි දක්වා තිබේ. මිහින්තලා රෝහල් පරිශ්‍රයෙන් හමු වූ පුරාවස්තූන් සහිත කුටියක්, ආරාමික සනීපාරක්ෂාව පිළිබිඹු කරන වැසිකිළි කැසිකිළි නිර්මාණ සම්බන්ධ කුටියක්, විදේශයන්ගෙන් මෙරටට ගෙන ආ විසිතුරු මැටි බඳුන් සහිත කුටියක් සහ විවිධ වර්ගයේ පුරාවස්තූන් ආදී වශයෙන් මෙම භූමි පරිශ්‍රයට අදාල පුරාවස්තූන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි අංශයන්ගෙන් මෙම කෞතුකාගාරය සමන්විත වේ. වන්දනාවේ පැමිණෙන බැතිමතුන් මේ පිළිබඳ අවධානය යොමු නොකළ ද අවශ්‍ය ඕනෑම අයෙකුට නොමිලේම නැරඹිය හැකි වටිනා කෞතුකාගාරයක් වන හෙයින් අධ්‍යාපනයේ නිරත වන්නන්ට සහ දේශීය ඉතිහාසය පිළිබඳ උනන්දුවක් දක්වන්නන්ට මෙයින් ඉටුවන සේවාව ප්‍රයෝජනයට ගන්නේ නම් මහත් දැනුමක් ලබාගත හැකි බව සඳහන් කළ යුතුය.

## 3.2 මිහින්තලේ පැරණි රෝහල

මිහින්තලේ පුරාවිද්‍යා කෞතුකාගාරයට නුදුරින් බටහිර දෙසින් ස්ථාපිත වී ඇති ඉපැරණි විහාර සංකීර්ණයට අයත් ආරෝග්‍යශාලා නටබුන් සමූහය මෙරටින් හමුවන

පැරණිතම රෝහල් සංකීර්ණයක සාධක වශයෙන් හඳුනාගත හැකි වේ. භික්ෂුණී උදෙසා මෙම රෝහල ස්ථාපිත කර ඇත්තේ  දෙවැනි සේන රජු විසින් බව පිළිගැනීමට ලක්ව ඇත. මෙම ආරෝග්‍යශාලාව පිවිසුම සහ රෝගී පරීක්ෂාවන් සිදුකරන කුටිය, දානශාලාව, ගබඩා කාමරය, උණු පැන් ගෙය, බෙහෙත් ඔරුව, බුදු මැදුර සහ ගිලන් කුටිවලින් සමන්විත වූ අංග සම්පූර්ණ රෝහලකි. විවෘත භූමියකින් යුතු ඉදිරිපස කොටසේ රෝගීන් පරීක්ෂා කරන කුටිය පිහිටුවා ඇත්තේ රෝහලේ ප්‍රවේශ ද්වාරය අසලින්මය. එහෙයින් එම කුටිය බාහිර රෝගී අංශයක් ලෙස ක්‍රියාත්මක වන්නට ඇති බවත්, රෝගීන්ගේ ආරක්ෂාව පිණිස රෝහලට ඇතුලත් කරගත යුතු රෝගීන් පමණක් එයින් ඇතුලත්කරගෙන සෙසු රෝගීන් ඖෂධ නියම කර පිටත්කර හරින්නට ඇති බවත් නිගමනය කළ හැකිය. ඒ අනුව පුරාතයින් රෝග බෝ වීම වළක්වාගැනීම පිළිබඳ මනා අවබෝධයක් පැමිණේ. ඒ ආසන්නයේම ඖෂධ ගබඩාව ද පිහිටුවා ඇත. විවෘත භූමියට සම්බන්ධ දානශාලාවත් උණුපැන්ගෙයත් නේවාසික රෝගීන්ගේ පරිහරණය උදෙසා පැවතී ඇත. නේවාසික රෝගීන් උදෙසා වෙන් වෙන් කුටි පිහිටුවා තිබීම තුළ විවිධ රෝග සඳහා වෙන් වෙන් වූ අංශයන් පිහිටුවීමෙන් බෝවන රොගාදියෙන් වැළකීමේ හැකියාව පවතී.



මෙම රෝහලෙහි පිහිටුවා ඇති ශෛලමය බෙහෙත් ඔරුව ඖෂධ දියරයන්හී රෝගීන් ගිල්වා තැබීම පිණිස භාවිත කරන ලද්දක් වන අතර එය මෙරටින් හමුවන විශිෂ්ටතම බෙහෙත් ඔරුව බව පුරාවිද්‍යාඥයින්ගේ මතයයි. රෝහල තුළ බුදු මැදුරක් ද පිහිටුවා තිබීම තුළ රෝගීන්ගේ මානසික ස්වස්ථතාව නිසි පරිදි පවත්වාගෙන යෑම උදෙසා මානසික සුවතා මධ්‍යස්ථානයක් වශයෙන් ද එය ක්‍රියාත්මක වන්නට ඇති බවත්, රෝගී භික්ෂූණ්ට ආගමික වතාවත් ඉටුකිරීමේ පහසුව ලබාදුන් ආකාරයක් ලෙසත් හඳුනාගත හැකි වේ. එමෙන්ම දානශාලාවක් ද රෝහල තුල පිහිටුවා ඇත. මිහින්තලේ මැද මළුවේ ප්‍රධාන දානශාලාව පිහිටුවා ඇතත් රෝගී භික්ෂූණ් එහි කැඳවීම වළක්වා ඔවුන්ට රෝහල තුළම ආහාර සැපයීම තුළ භික්ෂූ ආරාමයක පැවති සෞඛ්‍ය සුරක්ෂිතතාව මනාව පිළිඹිබු වේ. එමෙන්ම සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපි තුලින් රෝහලේ නඩත්තුව

සඳහා අවශ්‍ය කාර්යයන් ද අඛණ්ඩව රාජ්‍ය මැදිහත්වීම මත සිදු කළ බව හඳුනාගත හැකි ය.

## 3.3. මණිනාග විහාර පරිශ්‍රය

මහින්තලේ පුරාවිද්‍යා කෞතුකාගාරය පසුකර මිහින්තලා කන්ද තරණය කිරීමට ප්‍රථමයෙන් කඳු පාමුල පියගැටපෙළට වම් පසින් ඇති මණිනාග විහාර පරිශ්‍රය දැකගත හැකි වේ. පංචාවාසයකින් යුතු මෙම විහාරය භික්ෂු ආවාස වශයෙන් භාවිත කර ඇති අතර මෙය මණිනාග විහාරය හෝ මණිනාග මන්දිරය ලෙසින් හැඳින්වීමට හේතු වී ඇත්තේ සිව්වන මිහිදු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි 'මණිනාල්' නම් දෙව්දුව වැඳ පුදා ගැනීමේ ස්ථානයක් මෙම පරිශ්‍රයෙහි පිහිටා ඇති බව දැක්වීම තුළිනි. එහෙයින් මෙහි මණිනාල් දෙව්දුව වැඳපුදා ගැනීමේ ස්ථානයක් පවතින්නට ඇති බවත්, භික්ෂු ආවාස ද ඒ සමගින් ඉදිකර එක් සංකීර්ණයක් සේ පවතින්නට ඇති බවත් අනුමාන කළ හැකිය. මේ ආසන්නයේම ඇති පොකුණ මණිනාග පොකුණ ලෙසින් හඳුන්වන අතර මිහින්තලා කඳු මුදුනේ සිට ගලා එන ජලය මෙම පොකුණට ඒකරාශි කරගනිමින් ආරාමික භික්ෂූණ්ගේ පැන් පහසුව සලසන්නට ඇතැයි සැළකිය හැකි වේ. මණිනාග විහාර සංකීර්ණයට ඉදිරිපසින් වර්තමානයේ පිහිටුවා ඇති මල් වෙළෙඳසැල් කිහිපයට පිටුපසින් ද මෙවැනිම පංචාවාසයක නටබුන් දක්නට හැකි වේ.



## 3.4. ගිරිභණ්ඩ සෑය

මිහිනතලේ දානශාලා පරිශ්‍රයේ පිටුපසින් ඇති පෙත්මග ඔස්සේ ගමන් කිරීමේ දී හමුවන තිඹිරි පොකුණේ වම් ඉවුර මතින් ගමන්කර ගල් පඩිපෙල ඔස්සේ ගිරිභණ්ඩ සෑයට ප්‍රවේශ විය හැකිය. මෙය 'නමක් නැති ස්තූපයක්' ලෙස සංචාරයකයින්ගේ නෙත නොගැටෙන ස්ථානයකි. මිහින්තලේ දානශාලාවේ සිට මේ වෙත ගමන් කිරීම සඳහා අද වනවිට පෙත්මගක් නිර්මාණය කර තිබේ.

පුරාවිද්‍යාඥයින් හඳුන්වා ඇතත් ප්‍රදේශවාසීන් විසින් ගිරිභණ්ඩ සෑය ලෙසින් ව්‍යවහාර කරයි. බොහෝ දුරට මෙය මෙම ස්තූපය නිධන්හොරුන් විසින් විනාශ කර තිබීමෙන් එහි ධාතු සර්භයේ වූ පුරාවස්තූන් සහ වටිනා සිතුවම් විනාශ වී තිබී ඇති අතර පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් සංරක්ෂණය කර තිබේ. වර්තමානයේ



ද

පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ තැන්පත් කර ඇති ධාතු ගර්භය ගිරිභණ්ඩ සෑයට අයත් යැයි සැළකෙන අතර නිධන්හොරුන්ගේ ක්‍රියාවන් හේතුවෙන් එය බොහෝ දුරට හානියට පත්ව තිබේ. මෙහි යූප ස්ථම්භය කිරිගරුඬින් කරවා තිබී ඇත. පුරාවිද්‍යාඥයින්ගේ මතය වන්නේ මෙය පද්මාකාර හැඩයේ වූ ස්තූපයක් බවටයි. ගිරිභණ්ඩ සෑය සහ තිඹිරි පොකුණ ආශ්‍රිත මෙම පරිශ්‍රයෙහි විවිධ ගොඩනැගිලි නටබුන් හමුවන අතර කුඩා ස්තූප හයක් පමණ තිබී ඇති බවට සාධක ද හඳුනාගත හැකි වේ.

## 3.5. කණ්ටක චේතිය

ශ්‍රී ලංකාවේ ඉපැරණි ස්තූපය ආයකයන් අතරින් දර්ශනීයම ස්තූප ආයකය සහිත කණ්ටක චේතිය වෙත මිහින්තලේ ප්‍රධාන ගල් පඩිපෙලෙන් මෙන්ම සිංහ පොකුණ ආසන්නයෙන් ද ප්‍රවේශ විය හැකි වේ. ප්‍රධාන ගල් පඩිපෙල නගින විට දකුණු පසින් ඉතා ඉහළට විහිදී යන පරිදි ඇති ගල් පඩිපෙල ඔස්සෙ සහ, සිංහ පොකුණ ආසන්නයේ ඇති රථගාලෙන් ඉහළට විහිදී ඇති ගල් පඩිපෙලෙන් මේ වෙත ප්‍රවේශ විය හැකිය. සිද්ධාර්ථ කුමරුන්ගේ කණ්ථක අශ්වයා

සිහි වීම පිණිස කණ්ඨක චේතිය යැයි ව්‍යවහාර කරන්නට ඇතැයි සෙනරත් පරණවිතානයන් මත පළකර තිබේ. මුලින් කුඩාවට පැවති ස්තූපය ලජ්ජිතිස්ස රජු විසින් අද දැක්වෙන ආකාරයට සංවර්ධනය කර ඇතැයි පරණවිතනයන් දක්වා තිබේ. 1934 වසරේ කැණීම් ආරම්භ කර ඇති කණ්ටක චේතිය දැනට සංරක්ෂණයට බඳුන්කර ඇති අතර එහි ආයක සතරෙහි පහළ කොටස් ගලින් ද ඉහළ කොටස් ගඩොලින් ද නිමවා ඇත.

එහි උතුරු ආයකයේ සිංහ රුවක්, කල්ප වෘක්ෂය, ත්‍රි රත්න සංකේතය, ඡත්‍රය ආදී කැටයම් ශේෂ වී තිබේ. බටහිර ආයකයෙහි ඇත්තේ අශ්ව රුවක්, දකුණු ආයකයෙහි  වෘෂභ රුවක් සහ නැගෙනහිර ආයකයෙහි ඇත් රුවක් නිමවා ඇත්තේ සිව් දිශාවන් නියෝජනය කිරීමට ය. දකුණු ආයකයෙහි ඇඳි සිංහ රූ සහිත සිතුවම්වල ශේෂයන් අදටත් දක්නට හැකි අතර එහි කල්ප වෘක්ෂය, මිනිස් රූ මහාරාජ ලීලාවෙන් යුතු දෙවියෙකු කැටයම් කර තිබේ.



නැගෙනහිර ආයකය ඉතාමත් අලංකාර කැටයමින් යුතු ආයකය වන අතර නාග රූප, මානව රූප, විවිධ ඉරියව්වෙන් යුතු වාමන රූප, කල්ප වෘක්ෂ කැටයම්, ඇත් සහ නෙළුම් මල් සහිත මෝස්තර කැටයම් ආදියෙන් සමන්විත වේ. නැගෙනහිර ආයකයේ ඇති ගණපති රුව මෙහිලා සුවිශේෂී නිර්මාණයකි. සාමාන්‍යයෙන් ගතහොත් ගණපති යනු හින්දු ආගමික සම්භවයක් සහිත දෙවි කෙනෙකි. නමුත් බෞද්ධ පුදබිමක් වන කණ්ටක චේතියේ සිය පරිවාරයින් සමග සිටින ගණ දෙවි රුවක් කැටයම් කර ඇත. ඒ අනුව මෙය බෞද්ධ ආගමික ස්ථාන තුළට හින්දු ආගමේ බලපෑම පිළිබිඹු කරන්නා වූ මනා නිදර්ශනයකි. අනුරාධපුර මහාවිහාරය දීර්ඝ කාලයක් මුළුල්ලේ සිය ථෙරවාදී අනන්‍යතාව රැක ගනිමින් සිටිය ද අභයගිරිය, සෑගිරිය සහ ජේතවනය මහායාන මතවාදයන් ද පිළිගෙන ඇති අතර සෙසු ආගම්වලට ද යම් යම් ලිහිල් ප්‍රතිපත්තීන් අනුගමනය කර තිබේ. එමෙන්ම බෞද්ධ ජනතාව ද සිය අවශ්‍යතාවන් පූරණය කර ගැනීම සඳහා හින්දු දෙවි දේවතාවුන් වන්දනයට යොමු වී තිබේ. නූතනය වනවිට පන්සල් ආශ්‍රිතව (ශ්‍රී මහා බෝධිය සහ දළදා මාළිගය පවා) දේවාල ඉදිවී පවතින අතර එසේ ඉදි වූ මුල්ම අන්‍යාගමික දේව ප්‍රතිමාවක් වශයෙන් මෙකී කණ්ඨක චෛත්‍යයේ එන ගණදෙවි රුව පෙන්වාදිය හැකිය. බටහිර ආයකය ආසන්නයේ ඇති සෙල්ලිපියක් අනුසාරයෙන් මෙය 'කටක චෙත' ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වුව මිහින්තල

පුදබිමට පැමිණෙන සංචාරකයෙකු අනිවාර්යයෙයන්ම නැරඹිය යුතුම ස්ථානයක් වශයෙන් මෙම කණ්ටක චෛතිය පෙන්වාදිය හැක්කේ එහි ඇති අති විශිෂ්ට ශෛලමය කැටයම් සහ කලාත්මක වාස්තුවිද්‍යා ඉදිකිරීම් හේතුවෙනි.

## 3.6. මැද මළුව

මිහින්තලයට ප්‍රවේශ වන්නෙකුට A/9 මාර්ගයේ සිට මැද මළුව දක්වා ගමන්කළ හැකි මාර්ගයක් පවතින අතර මැද මළුව මිහින්තලා විහාරසංකීර්ණයේ වැදගත්ම ස්ථානයක් වේ. ප්‍රධාන ගල් පඩිපෙල ඔස්සේ යන්නන් අලංකාර ගඩොල් සහ ශෛලමය දොර උළුවස්සකින් මෙම ස්ථානයට ප්‍රවේශ වේ. මිහිදු ගුහාවන්, අටසැට ලෙන්, රාජගිරි කන්ද, කළුදිය පොකුණ හෝ මණිනාග විහාර ඇතුළු ඕනෑම ස්ථානයක සිට පහසුවෙන් ළගා විය හැකි කේන්ද්‍රයක මෙම මැද මළුව පිහිටා ඇත. එහෙයින්ම මැද මළුව වෙන් වී ඇත්තේ භික්ෂු ආරාමයේ මූලික අංගයන් වන දානශාලාව, සන්නිපාත ශාලාව සහ ධාතු මන්දිරය පිණිසයි.

### 3.6.1. දානශාලාව

මිහින්තලේ දානශාලවට ප්‍රවේශ වීමේ දී අභිෂේක මණ්ඩපයක් සහ ඇඹරුම්ගලක් ප්‍රථමයෙන්ම සම්මුඛ වන අතර මෙම දානශාලාව සැලසුම්කර ඇත්තේ විශාල ප්‍රමාණයේ මැද මිදුලක් ද සහිතවය. විශාල ප්‍රමාණයේ දැව වහලකින් යුතු වන්නට ඇතැයි අනුමානිත දානශාලාවේ

ආහාර තැන්පත්කර තැබීම පිණිස ගබඩා කාමරයක් ද පවතී. මෙය අභයගිරියේ දානශාලාවට බොහෝ සමානකම් දක්වන්නකි. මෙහි ඇති සුවිශේෂීම අංගයන් ද්විත්වය වන්නේ 'බත් ඔරුව සහ කැඳ ඔරුවයි'. මීටර් 12.80 ක දිගකින් යුතු බත් ඔරුව පළලින් මීටර් 1.15ක් වන අතර සෑගිරි විහාරවාසී සියළු භික්ෂූන්ගේ ආහාරමය අවශ්‍යතා සඳහා මෙම බත් ඔරුව ප්‍රමාණවත් වන්නට ඇත. බත් ඔරුව ආසන්නයේ ඇති කැඳ ඔරුව ද දිගින් මීටර් 4.5ක් වන අතර මෙය ව්‍යංජන වර්ග පිළිගැන්වීම පිණිස භාවිත කරන්නට ඇත. මෙම දානශාලාවට අත්‍යාවශ්‍ය වූ ජලය සපයාගෙන ඇත්තේ නාග පොකුණේ සිට නිමවා තිබූ නළ මාර්ගයකිනි.






අදටත් දානාශාලාව තුළට එසේ ජලය ගෙන ආ ගල් කණුවක් මත රැඳවූ ගල් පිහිල්ලක් සහ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති මැටි නල මීට නිදසුන් වේ. එසේ පිහිල්ල මගින් එන ජලය පොළොවට පතිත වීමේ දී දානශාලාවේ බිමට හානි නොවීම සඳහා එහි ගල් පුවරුවක් ද සහිකර තිබේ. සිව්වැනි මිහිඳුගේ මිහින්තලා පුවරු ලිපි අනුව මෙම දානශාලාවේ නඩත්තු කාර්යයන් ප්‍රධාන භික්ෂුවගේ මැදිහත්වීම මත ගිහි පැවිදි නිලධාරි මණ්ඩලයක් හරහා සිදුවී ඇති අතර ගිහි නිලධාරීන් සියල්ලෝම මෙම විහාරය හරහා වැටුප් ලැබූ ආරාමික සේවකයෝ වූහ. අවශ්‍ය ධාන්‍ය ගෙන්වීම, ඒවා සකස් කිරීම, ආහාර පිසීම ආදී කාර්යයන්ට වෙන් වෙන් වූ සේවකයින් සිටි අතර කාන්තා සේවිකාවන් ද කෙටීම්, පෙළීම් ආදියට සම්බන්ධ වී තිබේ. මෙම සේවකයින්ට පිරිසිදුව ආහාර පිසීමට හැකි ලෙස වෙනම නිල ඇඳුම් සහ නීති රීති පැවතුනු අතර මිහින්තලා පුවරු ලිපි තුළ ඔවුන්ගේ වැටුප් පිළිබඳ ව්‍යවස්ථාගත කොට තිබේ.

### 3.6.2. ධාතු මන්දිරය

මැද මළුවෙහි මධ්‍යයට වන්නට ඇති ධාතු මන්දිරය ඉතාමත් අලංකාර වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලින් යුතු සිත්ගන්නා ස්ථානයකි. භූගෝලීය පිහිටීම අනුව මාලක දෙකක් සේ සකස්කර ඇති ධාතු මන්දිරය වෙත පියගැටපෙළක් ඔස්සේ ප්‍රවේශ විය හැකි අතර එහි පහළ මළුවෙහි කුඩා ප්‍රමාණයේ ස්තූප දෙකක් දක්නට හැකි වේ.

ඉහළ මළුව ධාතු තැන්පත් කිරීම පිණිස යොදා ගන්නට ඇත. ඉහළ මළුවට ප්‍රවේශවන ද්වාරය දෙපසින් සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපි යුග්මය තැන්පත්කර ඇත. මධ්‍යකාලීන සිංහල අක්ෂර භාවිතයෙන් ලියා ඇති මෙම පුවරු ලිපි ද්විත්වය මීටර් 2.18 ක සහ මීටර් 2.17ක උසකින් යුක්ත වේ. මිහින්තලා විහාර සංකීර්ණයේ වැඩ වාසය කරන භික්ෂූණ්ගේ වගකීම් සහ ඔවුන්ගේ චර්යාවන් පිළිබඳ ව්‍යවස්ථාපිත නීති රීති ද, මෙම ආරාමයේ සේවය කරන සියළු සේවකයින් සම්බන්ධ නීති සහ ඔවුන් එකිනෙකාට ලබාදිය යුතු වැටුප් මට්ටම් ද, භික්ෂූණ් උදෙසා ලබාදිය යුතු දීමනාවන් ද, දානශාලාව ඇතුළු ස්ථානයන්හී කාර්යයන් සිදුවිය යුතු ආකාරය ද විස්තර කරන මෙහි මිහින්තලා විහාරයට අයත් භූමියේ ශාක සහ ජල පද්ධතිය සම්බන්ධයෙන් ද නීති පනවා පරිපාලනය විධිමත් කර ඇත.
අන්තරාලයකින් සහ ගර්භ ගෘහයකින් යුතු ධාතු මන්දිරය තුළ හිටි පිළිමයක් පිහිටුවා තිබූ පද්ම පීඨයක් පවතින අතර මිහින්තලා විහාර සංකීර්ණයට අයත් වටිනා පූජනීය වස්තූන් මෙහි තැන්පත් කර වන්දනාමාන කරන්නට ඇත. ධාතු මන්දිරයට පිටතින් එහි සිව්කොනින් කුඩා ස්තූප හතරක් පිහිටුවීමෙන් මෙහි අලංකාරත්වය තවදුරටත් වර්ධනය වී තිබේ.





## සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපි

### 1 ලිපිය

සිරිබර ක්ෂිත්‍රිය කුළයට කොතක් වැනි ඔක්කාක රජ පරපුරෙන් පැවතෙන ක්ෂිත්‍රිය උත්තම වූ අභය සළමෙවන් මහරජ හටල එම කුළයෙන් සංජාතවූ දේවී නම් අප්‍රධාන බිසෝ රැජින කුසයෙහි ඉපිදල ඈපා මහයා සිරි විඳල පිළිවෙල සේ රජ වීල තම සිරියෙන් ලක්දිව පහදවමින් සිටි සිරිසඟබෝ අභය මහරජහුල තමා සේසත් නැඟු සොළොස්වන අවුරුද්දෙහි වප් මස පුර පක්ෂයේ දසවක දවසල සෑගිරි වෙහෙරෙහි දල අභයගිරි වෙහෙරෙහි ද වසන මහ භික්ෂු සංඝ හිමිවරුන් මහ සන්නිපාත රැස් කරවාල තමාගේ සොහොයුරු රජ විසින් සෑගිරි වෙහෙරේ පෙර තැබූ සිරිතින් දල අභයගිරි වෙහෙරේ සිරිතින් දල ඃසංඝයා වහන්සේ) කැමති කරවා ගෙනල මේ වෙහෙරට මේ සිරිත් තිබීම වටීයැයි සුදුස්සන් සමඟ සසඳාල මේ වෙහෙරේ වසන භික්ෂු සංඝ හිමිවරුන්ට දල නිලධාරීන්ට දල දාසයන්ට දල කළයුතු දේ දල ලැබිය යුතු හා දියයුතු ආකාරය දල විචාරණයෙන් එක සමාන කොට මේ සිරිත් තැබූහ.

මේ වෙහෙරෙහි වසන භික්ෂු සංඝ හිමියන් විසින්ල බාල පැසුළු යාමයෙහි (ඉතා උදෑසනින්) නැඟිටල චතුර් ආරක්ෂා මෙනෙහි කොටල දැහැටි කිස නිමවාල සිඛකරණියේ කියා ඇති පරිදි සිවුරු හැඳ පෙරෙවල ඇතුල් වෙහෙරේ ලහබත් ගෙයට පැමිණල මෙත් පිරිත් සජ්ඣායනා කරල බැහැරවල කැඳ බත් ගත යුතු ය. ගිළන් වීමෙන් ලහබත් ගෙයට යා නොහෙන හිමිවරුන් ට වෙදුන් කියූ කල

(ආහාර) කොටස දිය යුතු ය. මේ වෙහෙර වසමින් විනය පිටකය උගන්නා භික්ෂු සංඝ හිමියන් ට වස්ත්‍රයෙන් හා ආහාරයෙන් කොටස් පහක් දල සූත්‍රාන්ත පිටකය උගන්නා භික්ෂු සංඝ හිමියන් ට කොටස් හතක් දල අභිධර්ම පිටකය උගන්නා භික්ෂු සංඝ හිමියන් ට කොටස් දොළහක් ද දිය යුතු අතරල දායකයන් තීරණය කොට සංඝයාහට දීමට සැළසූ ප්‍රත්‍ය නොපිරිහෙළා දිය යුතු ය.

මේ වෙහෙරට අයත් තාක් ආවාසයට බැඳුණු ගම් බිම්ල මෙහිම දැකුම් දීල නිබඳව වාසය කොට වළඳත් මිසල :මෙම විහාරයට) ආබද්ධ (වෙනත්) ආවාස හා එක්කාසු වී නොවැළඳිය යුතුය. සංඝ සමඟියෙන්ල නිලධාරීන් හට විධාන දෙතොත් හෝ තර්ජනය කරතොත් මිසල පෞද්ගලිකව නොවැදැරිය යුතු ය. මේ වෙහෙරේ වසන භික්ෂු සංඝ හිමියන් ඇතුල් වෙහෙරට බැඳි තාක් තැන්හි කුඹුරුල අරඹ (වතු) ආදිය කවර ආකාරයකින් හෝ භුක්ති නොවිඳිය යුතුය. තම නෑදෑ හිතවතුන් (ප්‍රති බද්ධ) විසින් ඇතුල් වෙහෙර ආබද්ධ තාක් තැන් හි නායක කම් කිරීමට නොදිය යුතුය. මෙම සිරිත් ඉක්මවූ හිමිවරුන් මේ වෙහෙරෙහි නොවිසිය යුතු ය.
වෙහෙර බලන හිමියන් දල වෙහෙර පරිපාලන නිලධාරියා දල නියමු ජොෂ්ඨයා දල අයකැමියා දල පරීක්ෂක නිලධාරියා දල වෙහෙර ලේකම් දල කරඬු ලේකම් දල කරඬු අතසන් කරන්නා දල ඇතුලත්ව මෙතුවක් දෙනා අභයගිරි විහාරයෙහි මූලායතන දෙකෙන් කටයුතු සම්පාදනයට පැමිණි සංඝයා වහන්සේ සමඟ ඇතුල් වෙහෙරෙහි සිට කටයුතු කොටල අභ්‍යන්තර - බාහිර

අය වැය ආදී කටයුතු කළ යුතු ය. අභ්‍යන්තර - බාහිර අයවැයෙහි නියුක්ත නිලධාරීන් නැසූ දෙයක් ප්‍රතිපූර්ණය කිරීම සඳහාල නිසි ගෙහිමියන්ගෙන් ඇප ගෙනල ප්‍රධාන නිලධාරීන් සමඟ තැබිය යුතු ය.

මේ වෙහෙර වසන හිමිවරුන්ගේ නෑ හිතවතුන් සිටිතහොත්ල සේවයේ නොතැබිය යුතු ය. සේවයෙන් ඉවත් කළ යුතු නිලධාරීන්ල :ඔවුන් ගේ භාරයේ පැවති) ලේඛන උපකරණ ආදිය ගෙන ඉවත් කළ යුතු ය. මුද්‍රා තබන කරඬුල ප්‍රධාන නිලධාරීන් සහ නිලධාරීන් ගේ මුද්‍රාවෙන් මුද්‍රා තබාල දාගෙහි නිලධාරීන් ඉදිරිපිට දී දාගෙහි තැබිය යුතු ය. මේ වෙහෙරෙහි නියුක්ත නිලධාරීන් අතරින් වෙහෙරේ කටයුත්තක් සඳහා වෙනත් තැනකට ගිය කෙනෙකුන් මිසල ස්ථානයේ සිටි නිලධාරීන් ගෙන්ල දන්වැට තබන තැන දල සහල් ගන්නා තැන දල පෙරවරු කැඳ බත් සාදන තැන දල තුන් දෙනෙකුගෙන් නොඅඩුව පසෙක සිටිය යුතු ය. ඇතුල් වෙහෙරේ දාගෙය ට සම්බන්ධ කවර වස්තුවක් වත්ල පිරුළට (තාවකාලිකව ණය ට) නොදිය යුතු ය. නිලධාරීන් විකුණා ද නොගත යුතු ය. මෙහෙයට බැඳුණු මිනිසුන් ගෙන්ල නිලධාරීන් තමන්ට මෙහෙ නොගත යුතු ය. වෙනත් තැනක මෙහෙයට නොදිය යුතු ය.

කණ්ඨක මහ සෑයෙහි නව කර්මාන්තයන්ට දම්ගමුවෙන් දුන් පැළල ඇතුල් වෙහෙරේ නිලධාරීන් බලාගෙනල දාගැබේ නව කර්මාන්ත කරවිය යුතු ය. කිරිහන්ඩ පවු දාගැබෙහි ආරක්ෂාවටල ඇල්ගමුවෙන් දුන් දෙ කිරිය දී ආරක්ෂා කරවිය යුතු ය. දාගැබෙහි දල මඟුල් මහ සල් පිළිමගෙහි දල මහබෝධිගෘහයේ

දල නයින්දේ දල මිණි නාල් දෙව් දූවගේ ගෙහි දල කණ්ඨක මහ සැයේ දල කිරිහන්ඩ පවු දාගැබෙහි දල පර්වතය මත සහ පහළ ඇතුල් වෙහෙර සම්බන්ධ දාගැබ්හි දල යන මේතාක් තැන් වල පූජා වෘත්තිය දල ඇතුල් වෙහෙරින් රන් කළං එක් සියයක් දල වී දස යාළක් දල යන මේ තාක් ගෙනල අවුරුදු පතා මේ වෙහෙරෙහි දාගැබ් ආදී සැම තැන්හි ම නව කර්මාන්ත කරවිය යුතු ය.

දාගෙයට ත්ල පිළිමගෙයට ත්ල අයත් ගුතල කරන්ද යන දෙගම්හිල දුම් මල් (හෝ දුම්මල) සපයන්නන් ගේ ගෘහ බද්ද කුඩා බද්දක් කරල පෙරළිකාරයන්ගේ බැළය වෙහෙරට ගත යුතු ය. කිරිහන්ඩ පවුවෙහි ගස් ගැසියෙන් (ගස් වැල්) තුනෙන් එකක් දල මෙහි සඟ්වැල්ලෙහි (එනම් ගමෙහි) ගෙවල් කුළිය දල මූණු වැව දල ළිහිණිය පවුවෙහි ඉහළ පහළ වැව් දෙක දල මෙහි සඟ්වැල්ල දල පහනැවිල්ල වටා බිම දල පොරොදෙනි පොකුණ වටා බිම දල මේ තාක් තැන් හි ලැබීම්ල වෙහෙරට ගත යුතු ය. වෙහෙරේ දාසයන් හා නිලධාරීන් හැරල වෙහෙර භූමියේ වසන ගෙහිමියන් ගෙන්ල බිම් කුළිය නිසි සේ වෙහෙර ට ගත යුතු ය. කසාවත් ගත් වේෂයට අනුරූප නොවනල ක්‍රය - වික්‍රය ආදී කටයුතු කරන්නවුන් ට දල පණිවා (ප්‍රාණඝාත) කරන්නවුන් ට දල පර්වත සීමාවේ විසිය නොදිය යුතු ය. වෙහෙර සඳහා මිස දැකුම්කළ වස්තු නිලධාරීන් නොගත යුතු ය. මේ වෙහෙරට ආබද්ධ තාක් ගම් බිම්ල කාර්යයන් හි බැඳ තැබීමට සළසනු මිසල බද්දට නොදිය යුතු ය.

තුන් දිනකට වරක් ලැබෙන නිවාඩුව මිසල පොහොයල මඟුල් ආදී සෙසු නිවාඩු නොගත යුතු ය. නිලධාරීන්ල වෙහෙර දාසයන් (තමන්

ට) ජීවිකාව පිණිස දුන්නාක් මිසල ඇතුල් වෙහෙරට ආබද්ධ තාක් තැන් වල උකස් / ප්‍රවේණි / බදු කොට කුඹුරුල රුප්පා (වතු) ආදිය නොවැළඳිය යුතු ය. වෙහෙරේ කටයුත්තකට ගිය නිලධාරීන්ල ශස්‍යකාරයන් දෙන පෙර සිරිත් බිළි සහල් මිසල බැහැරින් වැටුප් නොගත යුතු ය. ගෙහිමියන් ගෙන් පඬුරු නොගත යුතු ය. මොවුන් ගෙන් හීළෑ ගොනුන් ගෙනල නිලධාරීන් තමන් සඳහා ගොවිකම් නොකරවිය යුතු ය. ශස්‍යකාරයන් පරපුරෙන් පවතින බදු කුඹුරුල පවත්වාගත නොහැකි වුව හොත් මිසල :ඔවුන්ගෙන්) ලබා නොගත යුතු ය. වතු පෙත් වලට වැද නීති විරෝධී දේ නොකළ යුතු ය. ගස් කොළ නොකැපිය යුතු ය. මේ වෙහෙරට අයත් තාක් ගම් බිම් වල තලල මී ආදී පල ඇති රුක්ල නිලධාරීන් එකතුව දුනහොත් මිස කැපිය නොදිය යුතු ය.

ගෙහිමියන් කළ වරදක් ඇතොත් ගම් සිරිත් පරිදි දඩ ප්‍රමාණ කොටල ප්‍රමාණ කළ දඩය මැන සළකුණු කරල වට ප්‍රමාණය සොළොස් රියන් දල ගැඹුර රියනක් ද වූ කැබැල්ල බැගින් ගෙන වැව් මෙහෙ කරවිය යුතු ය. (වැව් මෙහෙය) නොකරතොත්ල ප්‍රමාණ කළ දඩය ගත යුතු ය. වෙහෙරට අයත් තාක් ගම් බිම් හි ලාභයන්ල ජීවිකා කොට දුන්නාක් මිස ඉතිරි තාක් තැන් සම්බන්ධයෙන් නිලධාරීන් සමඟ ප්‍රත්‍යක්ෂ වන සෙයින් අය කළ තාක් පඤ්චිකා පොතෙහි ලියවිය යුතු ය. මහපාක වෘත්තියට දල වැටුප් ගෙවීමට දල නව කර්මාන්තයන් ට දල දවස් පතා වැය වූ තාක් පඤ්චිකා පොතෙහි ලියවාල ප්‍රධාන නිලධාරීන් එකතු වී අත්සන් කරල සන් තැබිය යුත්තන්ගේ මුද්‍රාවෙන් පිහිටුවාල මුද්‍රා තබන කරඬුවෙහි තබාල මාසයක් මාසයක් පතා ම අත් පොත් ඉවත

ලාල එක් අත් පොතක් කොටල අවුරුද්දකට ඇති අත් පොත් දොළොසින්ල අවුරුදු අවසානයේ ලේකම් පොත කරවාල සංසයා මැද දන්වා නිමා කළ යුතු ය. මේ සිරිත් ඉක්මවූ නිලධාරීන් ගේ ගෙය දඩයට ගෙනල සේවයෙන් හැරිය යුතු ය.

## 2 ලිපිය

විහාරය බලන හිමියන් ට දවස් පතා සහල් එක් නැළියක් දල වස්සාන බණ ට රන් කළඳක් සහ සතර අකක් දල පවාරණ බණෙහි දී ද මෙතෙක් ම දල නියාමක දෙටුවෙකු හට ජීවිකාව පිණිස පස් කිරියක් දල දවස් පතා සහල් එක් නැළියක් දල අවුරුද්දකට සුදුකම් (හුණු ගෑම) සහ මල් මිල ට පසළොස් කළඳක් දල අයකැමියා දල වෙහෙරේ ලියන්නා දල කරඬු ලියන්නා දල කරඬු අත්සන් තබන්නා දල පරීක්ෂක නිලධාරියා දල ඃයන අයගෙන්) එක් අයෙකුට පස් කිරියක් බැගින් දල පිරිවහන වෘත්තියේ නිලධාරියෙක් හට එක් කිරි දෙපෑළක් දල සහල් මනා දෙක හමාරක් දල සරසන්නෙකු ට දෙපෑළක් දල සහල් මනා එකහමාරක් දල මඟුල් දෙටුවෙකු (ජොෂ්ය උත්සව සංවිධායක) හට එක් කිරියක් දල දමියෙන් (එනම් ගමෙන්) කොටසක් දල අවුරුද්දකට සුදු කම් හා මල් මිල ට කළං තුනයි දෙ අකක් දල පහන් වැටි නිලධාරියෙකු හට එක් කිරියක් දල දමියෙන් කොටසක් දල මහ බෝ සතුටු මංගලයෙහි පිළි සඳහා එක් කළඳක් දල මැටි පාත්‍ර කරුවෙකුට එක් පාදයක් දල සහල් දෙ පතක් දල ඃවෙහෙරින්) පිට මෙහෙකරුවෙක් හට දල රජගෙයි උපන්

නිලධාරියෙකු හට දල එක් අයෙකු ට එක් කිරි දෙපාදයක් බැගින් දල එක් අයෙකු ට මනා දෙක හමාර බැගින් සහල් දල සොළී බෙරවායෙකු ට දෙපාදයක් දල සහල් මනා එකහමාරකුත් දෙ පතක් දල පධානසර පරිපාලකයෙක් හට දෙපාදයක් දල දම්යෙන් කොටසක් දල රතන සූත්‍ර මහබෝ මංගලයෙහි පිළි සඳහා එක් කළඳක් දල පර්වත පරිපාලකයෙකු හට දෙ පාදයක් දල දම්යෙන් කොටසක් දල ඇළ නායකයෙකු (ජල සම්පාදක නායක) හට දෙපාදයක් දල සහල් මනා එකහමාරකුත් පතක් දල ජලසම්පාදකයින් එකොළොස් දෙනෙකු හට එක් අයෙකුට දෙපාදය බැගින් දල දම්යෙන් කොටස බැගින් දල කුළී කරුවන් සතර දෙනෙකු හට එක් අයෙකු ට මනා එක හමාරක් බැගින් සහල් දල එක් අයෙකු ට ජීවිකාව පිණිස දෙපාදය බැගින් ද (දිය යුතු ය.)

මේ වෙහෙරෙහි භික්ෂු සංඝ හිමියන් ට වැඩිමහලූ පිළිවෙලින් සිවුරු සකස් කොටල එක් අයෙකුට ලද්දාවූ (මිළ) සිවුරු සාදන නිලධාරීන් බෙදා ගත යුතු ද (වන අතර)ල වෙහෙරේ අත්සන් කරන දෙදෙනෙකු හට එක් අයෙකුට දෙපාදය බැගින් දල සහල් මනා එක හමාරකුත් පතක් බැගින් දල කෝෂ්ටාගාර ආරක්ෂක නායකයෙකු හට දෙපාදයක් දල සහල් මනා එක හමාරකුත් දෙ පතක් දල කෝෂ්ටාගාර ආරක්ෂකයෙකු හට දෙපාදයක් දල සහල් මනා එක හමාරක් දල දෙටු මව ට පාදයක් දල සහල් මනා එක හමාරකුත් දෙ පතක් දල බත් ගෙයි ලැදියට (බත් ගෙය භාර ස්ත්‍රියක් විය හැකි බව විමලකිත්ති හිමියන් ගේ අදහස යි) පාදයක් දල සහල් මනා එක හමාරකුත් දෙපතක් දල දාසීන් හට විධාන කරන ස්ත්‍රියක් හට දෙපාදයක් දල පිරිවර දාසීන් විසි හතර දෙනෙක් හට එක්

අයෙකුට පාදය බැගින් දල අවුරුද්දකට පිළි කාරයන් හට එක් අයෙකුට කළඳ බැගින් දල සඟ් වැල්ලෙහි උපන් නිලධාරියෙකු හට කිරියක් දල සහල් අඩ මනාවක් දල පිසින (උයන) සේවකයන් දොළොස් දෙනෙකු හට එක් අයෙකුට තළොල ගමින් (එනම් ගම) කිරියකුත් දෙ පාදයක් දල සේවක දෙටුවෙකු හට සහල් මනා එක හමාරකුත් පතක් දල දර ගෙනවුත් බත් පිසින සේවකයෙකු හට සහල් මනා තුන හමාරක් දල නො පිසල දර සපයන සේවකයෙකු හට දල ගමන් මුරය ගිය සේවකයෙකු හට දල එක් අයෙකු හට සහල් මනා දෙක හමාරක් බැගින් දල ගෙනා දර වලින් බත් පිසින සේවකයෙකු හට සහල් මනා එක හමාරක් දල පහයේ වසන දෙටුවෙකු හට දෙපාදයක් දල සහල් මනා එක හමාරකුත් පතක් දල පහයේ වසන එකොළොසක ට එක් අයෙකු හට දෙ පාදය බැගින් දල එක් අයෙකු හට සහල් මනා එක හමාරක් දල දවස් පතා යලා පහක් සපයන කුඹලුන් පස් දෙනෙකු හට එක් අයෙකු ට කිරිය බැගින් දල මාසයක් මාසයක් පාසා පාත්‍රා දහයක් සහ කළ දහයක් සපයන පාත්‍රා කුඹලෙකු හට කිරි දෙකක් දල සහල් මනා දෙක හමාරක් දල මසකට පෙරහන් කඩක් සපයන පෙරහන් සාදන්නියක ට කිරියකුත් දෙපාදයක් දල වෙදෙකු හට දෙතිසෑ හේනෙන් නින්ද ගම් (වශයෙන්) පැළක් දල දම්යෙන් කොටසක් දල කූඩළු වෙදෙකු හට (කූඩැල්ලන් යොදවා ලේ හරවන) දෙපාදයක් දල දම්යෙන් කොටසක් දල මඩොව්වෙකු හට (කෂාය සාදන්නෙකු විය හැක) කිරියකුත් දෙ පාදයක් දල දම්යෙන් කොටසක් දල නැකැතියෙකු හට කිරි දෙකක් දල දම්යෙන් කොටසක් දල කරණෑම්යෙකු හට කිරියක් දල දම්යෙන් කොටසක් දල දාගෙයි අත්සන් කරන්නෙකු

හට දල ගණ දෙටුවෙකු හට දල කරඬු ලියන්නෙකු හට දල වාර දෙටු (වාරයකට අනුව වෙහෙර ආරක්ෂා කරන ප්‍රධානීන්) තුන් දෙනෙකු හට දල ඃයන) මොවුන්ට ජීවිකාව පිණිස කරන්දෑගම දල වරින් වර දුම් මල් සපයන්නෙකු හට දමියෙන් කොටස් හතරක් දල දාගෙහි (පහන්) වැටි හා තෙල් සඳහා මෙම ගමින් පෑළක් දල දාගෙහි සුදු මල් ගෙනෙන මල් කරුවන් දෙදෙනෙකු හට මෙම ගමින් දෙ කිරියක් දල දමියෙන් එක බැගින් කොටස් දල මසකට එක සිය විස්ස බැගින් මල් දෙන මහනෙල් ගොවියෙකු හට සපු ගමින් දෙ කිරියක් දල සිත්තරෙකුට දෙ කිරියක් දල දාගෙය රකිනා රට ලද්දෙකු හට සහල් එක නැළියක් දල මහ බුදු ගෙහි දුම් මල් සපයන්නන්ට දල බණ වදාරණ දැහැමියන් ට දල දැහැමි ආචාර්යයන් ට දල යන සය දෙනෙකු හටල ඃයන) මොවුන්ට ගුතෑගම දල මහ බුදු ගෙහි මල් කරුවන් හට මෙගමින් දෙපාදයක් දල දමියෙන් කොටසක් දල මේ ගමෙහි දුම් මල් සපයන්නෙකුට දමියෙන් කොටස් දෙකක් දල කර්මාන්ත භාරකරුවන් ට අයෙකු ට දෙපාදය බැගින් දල එක් අයෙකුට මනා එක හමාරකුත් දෙපතක් බැගින් සහල් දල දාගෙහි බුද්ධ අභිෂේකයට තෙල් ගන්නා එක් බඳුනක් දල දිය පෙරහන එක් වස්ත්‍රයක් දල පිළිමගෙහි ද මේ තාක්ම දල ඃතැබිය යුතු ය)

කාර්මිකයන් (සම්බන්ධ) ලේකම් (තනතුර) දරන්නෙකු ට කිරියකුත් දෙපාදයක් දල සහල් මනා දෙක හමාරක් දල වඩු මහ ඇදුරෙකු හට බොඩ වෙහෙර නම් හේන දල වඩු ඇදුරන් දෙ දෙනෙකුට දල සීරු (කැටයම්) වඩු අට දෙනෙකු හට දල උළු වඩුවන් දෙ දෙනෙකු ට දල ඃයන) මොවුන්ට වඩු දෙවෑගම දල ලී වඩු දෙ දෙනෙකු හට එක්

අයෙකුට කිරිය බැගින් දල මණිකාර මහ ඇදුරු දෙදෙනෙකු හට එක් අයෙකු ට තුන් කිරිය බැගින් දල කඹුරන් (ලෝකුරු) දෙ දෙනෙකු හටල අයෙකු ට කිරියක් බැගින් දල හුණු පුළුස්සන්නන්ට හුණු බොල් දෙවැගම දල ගැල් කරු සය දෙනෙකු (වන) මොවුනට දුනුගම දල නවකම් වල නියුතු කැබළි ගමක දෙටුවෙකු හට කිරියක් දල සහල් මනා එක හමාරකුත් පතක් දල කැබළි ගම් වල දොළොස් දෙනෙකු හට සහල් මනා එක හමාර බැගින් දල මොවුනට ජීවිකාව පිණිස දෙපාදය බැගින් දල

නවගුණ මහ සැයෙහි දල නැටෙවිය මහ සැයෙහි දල ඇමබුලු මහ දාගැබෙ හි දල සෑ ගොවුවන් (දාගැබ් ආරක්ෂකයන්) තුන් දෙනෙකු හටල අයෙකු ට දෙ පාදය බැගින් දල මේ වෙහෙරේ උඩුගල ටල යටිගල ට (පර්වතය උඩ සහ පහළ) දල ඇත්වෙහෙරට ද ප්‍රති බද්ධ දාගැබ් ආදිය ඇමැදල පිරිසිදු කර රකින්නන් ට දම්යෙන් එක බැගින් කොටස් දල දාගෙහි දල පිළිමගෙහි දල බත් ගෙහි දල ːයන තැන් වල) මෙහෙ කරන මිනිසුන් පිණිසල පිළී දල පොරෝණා කවච දල හිස් වැසුම් දල අපුල්ලන රදවුන් දෙ දෙනෙක් දල ːදී) මොවුනට මඟුලව (ගමෙහි) තුන් කිරියක් දල

මේ වෙහෙරට බද තාක් ගම් බිම් හි මාර්ග බද්ද දල කුළී බද්ද දල මෙලාට්සි නම් බද්ද දල මේ වෙහෙරට ම නින්ද කොට ගත යුතු ය. මගතොට අයාළේ යන්නන් නොවදනා ලෙස ද කළ යුතු ය. කණුවැවෙහි දිය වදනා තාක් තැන් වලල පෙර දෙමළ (පාලන) කාලයේ දිය බද්ද මේ වෙහෙරට ම ගත යුතු ය. මේ වෙහෙරට ආබද්ධ තාක් ගම් බිම් කවර පරියායකින් හෝ උකස් කිරීමට හෝ ප්‍රවේණි කොට හෝ නොදිය යුතු ය. (එසේ) ගත්තවුන්ගේ රන්

(මුදල්) අභිමි කොට වෙහෙරට ම නැවත ගත යුතු ය. දුන්නවුන් දේශයෙන් යැවිය යුතු ය. (පිටුවහල් කළ යුතු ය) මේ නියමයෙන් තැබූ මේ සිරිත් නොඉක්මවා පැවැත්විය යුතු ය.

### 3.6.3. සන්නිපාත ශාලාව

විහාරවාසී භික්ෂූණ්ට ඒකරාශී වීම පිණිස තනවා ඇති සන්නිපාත ශාලාව මැදමළුවේ ගිණිකොනදිග කෙළවරට වන්නට දක්නට ඇත. චතුරස්‍රාකාර ගොඩනැගිල්ලක් වන මෙයට ප්‍රවේශ වීමට ද්වාර තුනක් දිශා තුනකින් පිහිටුවා තිබීමෙන් සංඝයා වහන්සේලා විශාල සංඛ්‍යාවකට රැස් වීමට පහසුව සළස්වා ඇත. මෙහි බටහිරපස පිවිසුමෙහි ඇති පියගැට මත ක්‍රි.ව.1-3 සියවස් අතර කාලයට අයත් අක්ෂරයන්ගෙන් යුතු සෙල්ලිපියක් හඳුනාගත හැකි වේ. සඳකඩපහණ් සහ කොරවක්ගලින් ද අලංකාරිත මෙම ප්‍රවේශයන් ඔසුසේ සන්නිපාත ශාලව වෙත ගමන්කළ විට එහි මධ්‍යයේ ඇති ශෛලමය චතුරස්‍රය දක්නට හැකි වේ.




කෙසේ වෙතත් මිහින්තලා විහාර පරිශ්‍රයෙහි ඇති භික්ෂු ආවාස වෙත අවධානය යොමු කළ විට එතරම් භික්ෂු පිරිසකට මෙය ප්‍රමාණවත් නොවන බව දක්නට ඇති හෙයින් මෙන්ම සිව්වැනි මිහිඳුගේ පුවරු ලිපි අනුව දානශාලාව ආසන්නයේ සලාකගෘහය පවතින බවට ඇති සඳහන අනුව මෙය සන්නිපාත ශාලාවක් නොවන බවටත්, සලාක බෙදා දුන් ස්ථානයක් ලෙසත් විද්වතුන් මත පළකර ඇත.

## 3.7. සේල චෛත්‍යය

මිහින්තලා පරිශ්‍රයේ උඩ මළුවෙහි පිහිටා ඇති සේල චෛත්‍යය ඉතාමත් අලංකාර නිර්මාණයකි. එක් පේසා වළල්ලක් මත පිහිටුවා ඇති මෙම ස්තූපය වටා ඇති ගල්කණු අනුව එහි ස්තූපඝරයක් ද පවතින්නට ඇති බව තහවුරු වේ. බුදුන් වහන්සේ මිහින්තලා පව්වට වැඩම කළ පසු උන්වහන්සේගේ පාද ස්පර්ෂය ලත් ස්ථානය වශයෙන් මෙම

ස්ථානය වන්දනාවට පාත්‍ර වේ. මිහිඳු හිමි වැඩමකළ පසු චුල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කළ ස්ථානයෙහි මෙම ශිලා ස්තූපය පිහිටා ඇතැයි ද මූලාශ්‍ර අනුව විශ්වාසය වේ.



කූටකණ්ණතිස්ස රජු විසින් මිහින්තලේ උපෝසථඝරය ආසන්නයේ කළ ශිලා චෛතිය මෙය වශයෙන් හඳුනාගනු ලබනුයේ මෙම ස්තූපයෙහි වර්තමානයේ පවතින හුණු බදාමයට යටින් එහි සැබෑ ශිලා පුවරු පිහිටා ඇති හෙයිනි. වලිසිංහ හරිස්චන්ද්‍රයන්ගේ ප්‍රමුඛත්වයෙන් මෙහි ප්‍රතිසංස්කරණ සිදුකරන විට ගල් පුවරු වසා හුණු ආලේප කළ බව වාර්තා වී තිබේ. ස්තූපයේ සළපතල මළුවෙහි කවන්ධ බුද්ධ ප්‍රතිමා යුගලයක්, චන්ද්‍රකාන්ති පාෂාණයෙන් කළ ගල් පුවරුවක්, සෙල්ලිපි, සිරිපතුල් ගල් ආදිය තැන්පත්

කර තිබේ. මෙම ඉහළ මළුවෙහි සේල චෛත්‍යය ආසන්නයේ මෑතකදී ඉදි කරන ලද සමාධි බුද්ධ ප්‍රතිමාවක් සහ ධාතු මන්දිරයක් පවතින අතර ගිණිකොන දෙසින් මිහින්තලා විහාර පරිශ්‍රයට අයත් බෝධීන් වහන්සේ රෝපණය කර තිබේ.

## 3.8. ආරාධනා ගල

මිහින්තලේ සංකේතීය අනන්‍යතාවය වන්නේ ආරාධනා ගලයි. මිහිඳු මහරහතන් වහන්සේ සහ දේවානම්පියතිස්ස රජු හමු වූ අවස්ථාව හා සම්බන්ධ කරමින් මෙම ආරාධනා ගල වන්දනාකරුවන්ගේ ආකර්ශනයට බඳුන් වී ඇත. ගලෙහිම කපා ඇති පියගැටපෙළක් ඔස්සේ ආරාධනාගල නැගීම මිහින්තලේ පැමිණෙන සෑම සංචාරකයෙකුම පාහේ සිදුකරන අතර එහි මතුපිටට ගමන්කළ විට අවට ප්‍රදේශයෙහි පවත්නා මහකණ්දරා වැව ඇතුළු වැව්, අනුරාධපුරයේ මහා ස්තූපයන් සහ කුඹුරු ඉඩම්වලින් සහ කැලෑබද රක්ෂිතයන්ගෙන් යුතු අතිශය මනස්කාන්ත දර්ශනයක් නැරඹිය හැකි වේ.



## 3.9. මිහින්තලේ මහ සෑය සහ මිහිඳු සෑය

අම්බස්ථල මහා සෑය යනුවෙන් ව්‍යවහාර කරන මහා ථූපය අවට ප්‍රදේශයන්හී සිට මිහින්තලය දෙස බලන්නෙකුට ප්‍රථමයෙන්ම ඇස ගැසෙන ස්තූපයයි. මහාදාඨික මහානාග රජු විසින් කරවන්නට ඇතැයි සැළකෙන මෙම ස්තූපය සිව්වැනි මිහිඳු රජුගේ පුවරුලිපියෙහි 'අම්බුලු දාගැබ' ලෙසින් ද පූජාවලියේ 'ඇඹුලු දාගැබ' ලෙසින් ද හඳුන්වා ඇති අතර මෙහි බුදුන් වහන්සේගේ ඌර්ණ රෝම ධාතුව නිධන්කර ඇතැයි සැලකේ. භූගෝලීයව විෂම ලක්ෂණ වලින් යුතු කඳු මුදුනෙහි මළුවක් බැඳ ඒ මත මෙම ස්තූපය කරවා ඇති අතර මුළුමනින්ම ප්‍රතිසංස්කරණය කර වැඩ අවසන්කළ ස්තූපයකි.

ස්තූපය ආසන්නයේම නූතනයේ කරවූ අලංකාර ප්‍රතිමා ගෘහයක් ද පවතී.



අම්බස්ථල මහ සෑයට දකුණු පසින් පිහිටා ඇති මිහිඳු සෑය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කිරීමේ දී සෙනරත් පරණවිතානයන් විසින් මෙය උත්තිය රජතුමා මිහිඳු හිමියන්ගේ භෂ්මාවශේෂ නිධන්කර තැනූ ස්තූපය යැයි හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම ක්‍රි.පූ. අවධියට අයත් අක්ෂර සහිත ධාතු කරඬු සහ බුද්ධ ප්‍රතිමාවහන්සේලා මෙහි ධාතු ගර්භයෙන් හමු වී ඇත. එම ධාතු කරඬු ඇතුළු පුරාවස්තු නව ධාතු මන්දිරයෙහි තැන්පත් කර තිබේ. කෙසේ වුව මෙම කෘතිය ලියැවෙන 2023 මැයි මාසය වනවිට මිහිඳු සෑයේ පැරණි පෙනුම මුළුමනින්ම පාහේ වෙනස් කරමින් එහි නව ප්‍රතිසංස්කරණයක් සිදුවෙමින් පවතී. වසර කිහිපයකට පෙර සංරක්ෂණය කළ ස්තූප ගොඩැල්ලක්ව පැවති මෙය සම්පූර්ණයෙන්ම ගොඩ නගා මේ වනවිට එහි කොත්

කැරැල්ලෙහි වැඩ නිමවමින් පවතිනුයේ මිහින්තලා විහාරාධිපති ස්වාමීන්වහන්සේගේ මැදිහත්වීමෙනි.

## 3.10. නාග පොකුණ

ස්වභාවික පර්වතයේ පිහිටි ගල් කෙමක් ආවරණය කරමින් ශෛලමය බැම්මක් බැඳීමෙන් නාගපොකුණ නිර්මාණය කර තිබේ. මෙය මූලාශ්‍රයන්හී නාගසොණ්ඩි හෝ නාගචතුක්ක ලෙස හඳුන්වා ඇති අතර ඊට හේතු වී ඇත්තේ මෙම පොකුණ තුලින් නැගී සිටින අලංකාර නාග රූපයක් ගල් බෙයදෙහි කැටයම් කර ඇති හෙයිනි.



ගල් පර්වතයෙන් ගලා එන අපිරිසිදු වැසි ජලය පොකුණට නොවැටෙන ආකාරයට ගලෙහි කටාරයන් කපා ඇති අතර එම කටාරයට පහළින් පොකුණ තුළින් නැගී සිටින බවක් පිළිබිඹු කරන පෙන පහකින් යුතු නාග රුව කැටයම් කර තිබේ. පොකුණු සහ වැව් ආශ්‍රිතව ආරක්ෂක

සංකේතයක් සේ මෙසේ නාග රූප කරවීම සමකාලීනව පවතින්නට ඇති සම්ප්‍රදායකි. මෙ පොකුණට පිටතින් කළුගලින් සැකසූ ළිඳක් පවතින අතර එම ළිඳ හරහා මිහින්තලේ දානශාලාවටත් සිංහ පොකුණටත් මැටි නළ මාර්ගයෙන් ජලය ගෙන ගොස් ඇති බවට සාධක පවතී.

## 3.11. සිංහ පොකුණ

අටසැටලෙන් සහ කණ්ටකචේතිය ඇසුරු කරගත් භික්ෂු ආවාසයන් උදෙසා ජල සැපයුමක් ලෙස නිමවා ඇති සිංහ පොකුණ එනමින් හඳුන්වනුයේ එහි ඇති අලංකාර සිංහ කැටයම හේතුවෙනි. පිහිට ගල කැණ ඒ වටා තුන් පසෙකින් ගල් බැම්මක් බැඳීමෙන් මෙම පොකුණ නිර්මාණය කර තිබේ. නාග පොකුණේ සිට සිංහ පොකුණ දක්වා ජලය ගෙන ඒමට මැටි නළ මාර්ග පද්ධතියක් පැවති ඇති අතර එය අවසන් වී සිංහ පොකුණට ජලය වැටෙනුයේ ශෛලමය මකරෙකුගේ මුඛයක් මධ්‍යයෙනි. පොකුණ බැඳ ඇති ගල් පුවරු ඉතාමත් අලංකාර කැටයමින් යුක්ත වේ.

විවිධ ඉරියව්වලින් යුක්ත සිංහ රූප, ගජසිංහ රූප, නර්තනයේ යෙදෙන වාමන රූප, මල්ලවපොර කැටයම්, ඍෂිවරයෙකුගේ සහ ඇතෙකුගේ රුව, කාන්තා රූප සහ වීනා හා බටනලා වාදකයින්ගේ රූප ඇතුළත්ව සියුම්ව නෙළන ලද ගල් කැටයම් මෙම පුවරුවල දක්නට හැකි වේ. පොකුණේ සිට ප්‍රයෝජනය උදෙසා ජලය පිට කරන්නේ ද පිහිටි ගලෙහිම කොටන ලද සිංහ රුවක් හරහාය. අත් ඔසවා

සිටගෙන සිටින සිංහයාගේ මුඛය සහ පොකුණ සම්බන්ධ කරමින් සිදුරක් තනා එමගින් පිහිල්ලක් සේ භාවිත කළ හැකි ආකාරයට ජලය නිකුත් කර ඇත. මෙම මිහින්තලයේ පමණක් නොව ශ්‍රී ලංකාවේ ම දක්නට හැකි අති අලංකාර පොකුණක් වශයෙන් සැළකිය හැකිය.



## 3.12. ඇත් වෙහෙර

මිහින්තලා පුදබිමෙහි ඇති උසින්වැඩිම ස්ථානය වන්නේ ඇත් වෙහෙර කන්දයි. මැද මළුවේ සිට තනා ඇති පියගැටපෙළක් ඔස්සේ ඇත් වෙහෙර කන්ද මුදුනට ගමන්කිරීම පරිසර චමත්කාරය විඳිය හැකි අත්දැකීමකි. එම ගමන අතරතුරදී ගොඩනැගිලි නටබුන්, දර්ශනීය ජෛව

පද්ධතිය, ඈත මෑත නැරඹිය හැකි දර්ශන තල ආදිය ද හමු වේ.





ඇත් වෙහෙර කඳු මුදුනෙහි කුඩා පර්වතයක් ප්‍රථමයෙන්ම හමුවන අතර එම පර්වතය මතට නැගීමෙන් ඈතින් පිහිටි රිටිගල කන්ද, ලබුනෝරුව කන්ද, කටුපොත කන්ද, නුවර වැව, අනුරාධපුර නගරය සහ මහා ස්තූපයන්

ඇතුළුව සුවිශාල භූමි ප්‍රදේශයක් දර්ශනය වන අතර සන්ධ්‍යා කාලයෙහි හිරු බැස යන දර්ශනය නැරඹිය හැකි මෙම ප්‍රදේශයේ පවත්නා සුදුසුම දර්ශන තලය මේ යැයි යෝජනා කළහැකි වේ. මෙම ඇත් වෙහෙර කඳු මුදුනෙහි පවත්නා ස්තූපය මහාදාඨික මහානාග රජු විසින් කරවා ඇති අතර එය දැනට සංරක්ෂණයට බඳුන්කර තිබේ.

## 3.13. කටුසෑය

වර්තමානය තුළ මිහින්තලා මහා සෑය තරමටම ප්‍රසිද්ධ ස්ථානයක් බවට පත්ව ඇති කටු සෑය A/9 මාර්ගය ආසන්නයේම සැදැහවතුන්ගෙන් නිරතුරුවම සමන්විත වූ පුදබිමක් සේ පෙන්වාදිය හැකිය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් කැණීම් කර සංරක්ෂණය කර ඇති මෙහි පේසාවන්ගෙන් ඔබ්බෙහි ඉතා අලංකාර නෙළුම් පෙත්තක කැටයමක් සහිත ගල් පුවරුවක් අල්ලා තිබේ. ස්තූපයේ සලපතල මළුවෙහි ගල් පුවරුවක එකිනෙකාට මුහුණලා සිටින නාග රූප දෙකක් ද කැටයම් කර තිබේ. මෙම නාග රූප සහිත ගල් පුවරුවෙහි පොල් ගසන බැතිමතුන් හේතුවෙන් එයට හානි පැමිණෙන හෙයින් මෑතකදී එහි වීදුරු පුවරුවක් සවිකර ඇතත් ඊට කාසි සහ මුදල් දැමීමට බැතිමතුන් යොමු වී තිබේ. හුදෙක් බෞද්ධ ස්තූපයකටත් වඩා මෙම කටුසෑය ප්‍රකට වී ඇත්තේ භාරහාර වීමට, පුල්ලෙයාර පූජා පැවැත්වීමට, බහිරව පූජා තැබීමට සහ පොල් ගැසීමට

සුදුසු ස්ථානයක් වශයෙනි. එහෙයින්ම කටුසෑය මිහින්තලා පුදබිමේ පවතින සක්‍රීයම ස්ථානය සේ පෙන්වා දීමට හැකිය.



## 3.14. ඉදිකටුසෑය පරිශ්‍රය

කටුසෑය ආසන්නයේම ශෛලමය ප්‍රාකාරයකින් වටකර ඇති පරිශ්‍රය ඉදිකටුසෑය පරිශ්‍රය සේ හඳුනාගත හැකි වේ. අලංකාර පුන්කලස් සහ කොරවක්ගලින් යුතු ප්‍රවේශයකින් මෙම පරිශ්‍රයට ඇතුළුවිය හැකිය. ඒ තුළ ජන්ථාඝරයක්, විශාල පොකුණක් සහ ගොඩනැගිලි කිහිපයක නටබුන්, උපෝසථඝරයක්, ඉදිකටු සෑය, පංචාවාසය සහ තවත් සංරක්ෂිත අලංකාර පොකුණක් පවතී. ජන්ථාඝරයේ සහ උපෝසථඝරයේ ගල් කණු ශේෂ වී ඇතත් ඒවා සංරක්ෂණය කර නොමැත. මෙතුළ ඇති අලංකාර ස්තූපය ඉදිකටුසෑය යි. පළමුවැනි සේන රජු විසින් කරවා ඇතැයි තහවුරු කෙරෙන මෙම ස්තූපය තුළින් මහායාන සූත්‍ර සහිත

තඹ තහඩු 91ක් හමු වී ඇත. ඊට අමතරව පොළොන්නරු අවධියට සහ මහනුවර අවධියට අයත් පුරාවස්තූන් ද මෙයින් හමු වී ඇති බැවින් පසුකාලීනව ප්‍රතිසංස්කරණයක් සිදුවන්නට ඇතැයි අනුමාන කරයි.



ස්තූපය පසුකර යනවිට හමුවන අලංකාර පුන්කලසින් යුතු ප්‍රවේශ ද්වාරයන් සතරක් සිව් දිශාවෙහි පිහිටවූ මළුවක් මධ්‍යයේ පංචාවාසයක් දක්නට හැකිය. සංරක්ෂණය කර ඇති මෙම පංචාවාසය නාගරාජ රූප සහිත මුරගල්, සරල සඳකඩපහන්, කැටයමින් යුතු කොරවක්ගල් ආදියෙන් ද අලංකෘත වූ නිර්මාණයන් වේ. පංචාවාස මළුවට පිටුපසින් ඇත්තේ හොඳින් ඔපමට්ටම් කළ ගල් යොදාගනිමින් නිමවූ පොකුණකි. පුන්කලස් සහිත පියගැටපෙළකින් පොකුණට ප්‍රවේශ විය හැකිය. පංචාවාස පරිශ්‍රයේ සිට මෙම පොකුණ වෙත ශෛලමය කාණුවක් ද නිමවා ඇත. වර්තමානය වනවිට සංරක්ෂණය කළ මෙහි යම් මට්ටමක් දක්වා ජලය පිරී ඇති ආකාරය ද දැකගත හැකිය.

## 3.15. රාජගිරි කන්ද ලෙන පරිශ්‍රය



මිහින්තලේ තවත් එක් ශේෂ කන්දක් වන රාජගිරිලෙන් සහිත කන්ද මුදුනට ගමන් කිරීම සඳහා පියගැටපෙළක් පිහිටුවා ඇති අතර මෙයින් විශාල ප්‍රමාණයේ ගල් ලෙනකට ප්‍රවේශ විය හැකිය. මුරගල් සහිත පියගැටපෙළක් ඔස්සේ ප්‍රවේශ වීමට මෙම ලෙන් පරිශ්‍රයෙහි කුටියක් තනා තිබී ඇත. කටාර සහිත ගල් බෙයදට සම්බන්ධ කරමින් බිත්ති ගොඩනංවා කුටි සකස්කර තිබූ බවට සාධක මෙහි දක්නට ඇත. එම කුටිවල ගල් බෙයදෙන් ඉදිරියට පැවති කොටස සඳහා පියස්සක් ද නිර්මාණය කර තිබී ඇත. මෙම ලෙන්වල කටාරයට පහළින් පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපි හඳුනාගත හැකි වේ. ගල් ලෙන්වලට ඉදිරියෙන් පොකුණක් සහ වේදිකාවක් පවතින අතර වේදිකාවේ සක්මන්

මළුවකි. රාජගිරි කන්දේ මෙම ලෙන් සහිත ගල් කුලෙහි මතුපිටට තරමක් දුෂ්කර උත්සහයකින් පසුව නැගීමට ද හැකි අතර ඒ මතුපිට කුඩා ස්තූපයක් පැවති බවට නටබුන් ද වේ. මෙම කඳු මුදුනට ද ඇත් වෙහෙර කන්දට මෙන්ම මනස්කාන්ත පරිසරය දර්ශනය වේ.

රාජගිරි කන්දේ ලෙන්වලට අමතරව මෙම කඳුපාමුල යම්කිසි විහාර අංගයන් පැවති බවට සාධක දැකගත හැකිය. ඒ අතර ස්තූපයක නටබුන්, ප්‍රතිමා ගෘහයක නටබුන්, බහිරව රූප සහිත මුරගල්, අලංකාර පියගැටපෙළ, කොරවක්ගල්, මල් ආසන, ආවාස ගොඩනැගිලි සහ පොකුණු ආදියෙන් සමන්විත පබ්බත විහාරයක නටබුන් මෙම බිමෙහි විසිර පවතී.

## 3.16. අටසැටලෙන්


මහාවංශයට අනුව මිහිඳු හිමි ඇතුළු මෙරට මුල්ම භික්ෂු කණ්ඩායමේ නේවාසික අවශ්‍යතා සඳහා දේවානම්පියතිස්ස රජු විසින් මිහින්තලයේ ලෙන් හැට අටක් සකස්කරපූජා කර තිබේ. කණ්ටක චෛතිය ආසන්නයෙන් පහසුවෙන් ප්‍රවේශ විය හැකි මෙම ලෙන් පද්ධතිය කටාර කොටා වාසය සඳහා සුදුසු ලෙස සකස්කර ඇත. මිහින්තලයෙන් හමුවන බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපි බොහෝමයකට හිමිකම් කියනුයේ මෙම අටසැටලෙන් ය. ඇතැම් ලෙන් මේවනවිට තුඹස් බැඳීමෙන් ජරාජීර්ණ වී ඇතතත් අලංකාර පරිසර පද්ධතියකින් යුතු මෙම ස්ථානය ද

මිහින්තලයේ ඇති ආකර්ශනීය ස්ථානයක් සේ සැළකිය හැකිය.

## 3.17. කළුදියපොකුණ පරිශ්‍රය

වර්තමාන A/9 මාර්ගයේ සිට කටුසෑය පසුකර නුවර දෙසට ගමන් කරනවිට වම්පසින් කළුදියපොකුණ වෙත ගමන් කිරීමේ මාවත හමුවේ. මෙම සංකීර්ණයට ප්‍රවේශ වීම සඳහා පොකුණ ඉස්මත්තේ ප්‍රවේශ ද්වාරයක් කරවා තිබී ඇති අතර මේ වනවිට එය සංරක්ෂණය කර තිබේ. එම විහාර සංකීර්ණයට අයත් ස්තූපයක් ද ඒ ආසන්නයේම උස් වේදිකාවක් මත කරවා ඇත. නිරන්තරවම කළු පැහැයෙන් දිස් වෙතැයි කියන කළුදිය පොකුණ වර්තමානයෙත් ප්‍රයෝජනයට ගත හැකි ජලයෙන් පිරීගිය අලංකාර පොකුණකි. පිහිටි ගල මෙන්ම ශෛලමය ගල් බැම්මක් බැඳීමෙන් ද නිර්මාණය කර ඇති කළුදිය පොකුණේ ජලය අතීතයේ විහාරවාසී භික්ෂූණ්ගේ පරිභෝජනයට වෙන් වන්නට ඇති අතර වත්මනෙහි පවා අවට ප්‍රදේශවාසීන් ස්නානය පිණිස මෙම පොකුණ භාවිත කරයි. පොකුණ මධ්‍යය වෙත එළඹෙන පරිදි නැවක ඉදිරිපස කොටස සිහිගන්වන වාස්තු විද්‍යාත්මක ඉදිකිරීමක් දැකගත හැකිය. මෙය භික්ෂූණ් විසින් ජලය ඇසුරෙහි සිදු කරන උපෝසථාසාර ක්‍රියාවලියකට සම්බන්ධ ගොඩනැගිල්ලක් විය හැකිය. පොකුණ පසුකර ප්‍රධාන පිවිසුම ඔස්සේ ඉදිරියට ගමන් කිරීමේ දී හොඳින් සකස් කරන ලද ගල් ලෙන්

විහාරයක් දක්නට හැකිය. කටාරකෙටූ ලෙන භාවිතකර ද්වාරයකින් සහ පනේලවලින් සමන්විත කුටියක් ලෙස භික්ෂූණ්ට නේවාසිකව වැඩ වාසය කළ හැකි සේ නිමවා ඇති මෙම ඉදිකිරීම සංචාරකයින් අතර ප්‍රචලිතව ඇත්තේ පොත්ගුලක් වශයෙනි.





මීට අමතරව මෙහි පථානසර ගොඩනැගිල්ලක්, වැසිකිළි ගල්, ගල් ආසනයක් ඇතුළුව ගොඩනැගිලි නටබුන් කිහිපයක්ම දැකගත හැකි වේ. වර්තමානය වනවිට මෙම කළුදියපොකුණ සංකීර්ණයට නුදුරින් ඇත්පැටියාකන්ද ආශ්‍රය කරගනිමින් අරණ්‍යවාසී භික්ෂුණීවහන්සේලා වැඩහිඳින අතර තපෝවනය යැයි ප්‍රසිද්ධ එය භාවනායෝගී භික්ෂුණී උදෙසා වෙන්ව ඇති බැවින් අවසරයකින් තොරව නැරඹීම භික්ෂුණී වහන්සේලාට බාධාවක් විය හැකිය.

